මතුගම අධ්‍යාපන කලාපය Matugama Education මත්துகம கல்விக் வலயம்

# මතුගම අධ්‍යාපන කලාපය

## දෙවන වාර පරීක්ෂණය - 2020 මාර්තු

| සිංහල - I<br>71 S - I | 12 ශ්‍රේණිය | කාලය : පැය 3 යි |
|---|---|---|

♦ අමතර කියවීමේ කාලය විනාඩි 10

♦ පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 5 කට පිළිතුරු සපයන්න.

01. පහත දැක්වෙන (අ), (ආ), (ඉ), (ඊ) සහ (උ) උද්ධෘත අතුරෙන් හතරක් තෝරාගෙන ඒ ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට ද (ඌ) සහ (ඒ) ප්‍රශ්නවලට ද පිළිතුරු සපයන්න. (මේ ප්‍රශ්නයට පිළිතුරු ලිවීමේ දී වර්තමාන ලේඛන ව්‍යවහාරයම යොදා ගන්න.)

02.

(අ) එක් දවසක් කුමරුන්ගේ මැණියෝ බමුණානන්ට වස්තුලෝභයෙන් ඊ අවස්ථාවක් නැතත් තුමූ පුතණුවන්ගේ සැටිය දැක බමුණානන් බණවාලා 'තොපගේ පුතණුවන් සැටි පෙවෙත් නපුර උන් තමන් නොකියතත් ලෙඩක් දුකක් ඇත්තා සේය. ඊට නිසිපිළියම් දන්නා කෙනෙකුන් ගෙනවුත් පිළියමක් කරව'යි උන්ගේ අදහස් ආභරණය කළ ලෙසින් ම නොහැඟුණා සේ කිවු ය. බමුණාණෝ ඒ අසා 'පින්වත් බැමිණි කුමක් කියයි ද ? පිළියමට වෙදවරුන් ගෙනා කල වෙදකම් නිමන තෙක් බතුත් දුන මැනව. කෙළවර මිලත් දුන මැනව. බලවත්ව තිබෙන ව්‍යාධි හෙයින් මිලත් මඳකින් සෑහි නොයෙයි.'

(i) බැමිණිය පුතුගේ අසනීපය තම ස්වාමියාට ප්‍රකාශ කිරීමට ප්‍රථමව සිතුවේ කුමක් ද?

(ii) අසනීපය සඳහා කළ යුතු දේ බැමිණිය පැවසුයේ කෙසේ ද ?

(iii) 'උන් තමන් නොකියතත් ලෙඩක් දුකක් ඇත්තාසේය.' ලිහිල් බසින් ලියන්න.

(iv) බණවාලා කෙටි විවරණ සපයන්න.

(ආ) බිසොවු තුන්වාරයක කැවුම් යවා කුසීතම "දරුවන් පැරදිපැරදි සේ මම කැවුම්තලි යවාගත නොහෙමි. ඉතිකින් ගෙයි කැවුම් නැතැයි" කියා යවුවාහුය. අනුරුද්ධ කුමාරයෝ "කැවුම් නැතැ" යි යන බසක් නොඇසු විරූ හෙයින් "නැතැ" යි යන බසෙහි අර්ථය නොදැන "නැතිපූ යයි යන පූ ජාතියෙක් ඇති වනැ" යි සිතා "එනැතිපූ වහා එවන්නේය"යි කියා යවුවාහු ය. මැණියෝ ඒ බස් අසා තමන් අතුරෙහි සිනාසී "මාගේ පුතණුවෝ තමන් ශ්‍රී මත්කුලෙහි උපන් හෙයිනුත් මහපින් ඇති හෙයිනුත් නැතැයි යන බසෙහි අර්ථ නොදනිති. මපුතණුවන් මතු රාජ්‍ය කරන කළ නැතැයි යන බසක් නොකියා රාජ්‍ය කළ නොහැක්කේ ම වේ ද, මපුතණුවන් නැතැයි යන බසෙහි අර්ථය උගන්වම්" යිසිතාලා "රන් තලියක් ශුද්ධ කරවා පියා අනික් රන්තලියකින් වසාලා "තෙලෙ නැති පූ මපුතණුවන්ට දෙව" යි කියා නිකම් තලිය යැවුවාහුය.

(i) බිසව කී වාරයක් කැවුම් යැවුවෙ ද ?

(ii) නැති පූ එවන ලෙස කුමරු කී කල බිසව කළේ කුමක් ද ?

(iii) තෙලෙ නැති පූ මපුතණුවන්ට දෙව' ලිහිල් බසින් ලියන්න.

(iv) ශ්‍රීමත්කුලෙහි යන යෙදුමට කෙටි විවරණ සපයන්න.

(ඉ) පෙර මේ අනුරුද්ධකුමාරයෝ එක් ජාතියෙක දිළිඳු වූ එක් කුලයෙක ඉපැද අසුන්ට තණ දා තණකත් ඇද ජීවත් වෙති.එසමයෙහි උපරිට්ඨ නම් පසේ බුදුකෙනෙකුන්වහන්සේ දැක තමන් බැලමෙහෙ කොට ලත් බත් කොට්ඨාසය උන්වහන්සේගේ පාත්‍රයට පිළිගන්වාලා "මේ පිනින් මතු මෙසේ වූ දිළිඳුකුලයෙක නූපදිම්වයි උතුම් වූ රජකුලෙහි උපදිම්වයි එසේ ඉපැදත් නැතැයි යන බසෙහි අර්ථ නොදනිම්ව" යි කියා ප්‍රාර්ථනා කළා හුය. ඒ පින් බලයෙන් මෙසමයෙහි ශාක්‍යකුලයෙහි ඉපැද "නැතැයි"යි යන බසෙහි අර්ථ නොදැක දිව්‍ය වූ කැවුම් කා ම වැඩුණාහුයයි දත යුතු

(i) අනුරුද්ධ කුමරු පෙර ආත්මයක කවරෙකු වී ද ?

(ii) පසේ බුදුන්ට පූජා කළ පිනින් පැතුවේ මොනවා ද ?

(iii) 'එක් ජාතියෙක දිළිඳු වූ එක් කුලයෙක ඉපැද අසුන්ට තණ දා තණකත් ඇද ජීවත් වෙති.'
ලිහිල් බසින් ලියන්න.

(iv) 'බැලමෙහෙ' යන යෙදුමට කෙටි විවරණ සපයන්න.

(ඊ) එකල අප බුදුන් සමීපයෙහි එක් කුලයෙකින් එක්දරුකෙනෙකුන් බැගින් මහණ කරවන සමයෙහි මහානාම නම් ශාක්‍යයෝ තමන් මලණුවන් මෙකී අනුරුද්ධකුමාරයන් ළඟට කැඳවාලා "මලණ්ඩ, බුදුන් කරා ගොස් අප දෙබෑයන් අතුරෙන් එක්කෙනෙකුන් මහණ වුව මැනව. මම මහණ වෙම් ද, තෙපි මහණ වවු ද ?" යි විචාළහ. එබසට අනුරුධකුමාරයෝ කියන්නා හු "බෑණන්වහන්ස බුදුන් කෙරේ මහණ වූ කල එක් වේලේ කෑව මනාල එසේ වූ බතක් දොර දොර සිඟා ඇවිද ලද මනාල බඩසායයි කියා නොහැකිල ඇඹුල් ලුණු බෝය. මඳ යයි කියා නොහැකිල හුණු කැමැත සිහිල් ලැබේල සිහිල් කැමැත හුණු ලැබේල, දිව්හිමියෙන් එකලාව ම හොත මනාල රුක්මුල් සුසාන භූමිවල භාවනා කොට ඇවිදද මනාල, එසේ වූ දුක් මම විඳ ගත නොහෙමි" යි කීහ.

(i) බුදුන් කල තිබූ සිරිත කුමක් ද ?

(ii) මහණ වීම සඳහා අනුරුද්ධ කුමරු අකමැති වීමට හේතු කවරේ ද ?

(iii) "මලණ්ඩ බුදුන් කරා ගොස් අප දෙබෑයන් අතුරෙන් එක්කෙනෙකුන් මහණ වුව මැනව"
ලිහිල් බසින් ලියන්න.

(iv) එකලාව ම කෙටි විවරණ සපයන්න.

(උ)
නිල් මිණි රැස් පැතිර
නිල්වත සිතඹ පුරඹර
ගජ මද හෙත විසිර
එපුර වහරෙව් දිසි හැටවර

හය කුර රොන් ගසින්
ගිජිඳු ගිජිඳුන් වෙසෙසින්
හළ පොකුර'ඹ රසින්
තුරග සැනසෙති එපුර සතොසින්

(i) නිල්මිණි රැස් පැතිරීමෙන් සිදුවන්නේ කුමක් ද ?

(ii) හැම විටම නගරය දිස් වන්නේ කවරාකාරයෙන් ද ?

(iii) 'ගිජිඳු ගිජිඳුන් වෙසෙසින්' පද්‍ය පාදයේ අර්ථය ලියන්න.

(iv) පොකුරඹ කෙටි විවරණ සපයන්න.

(ලකුණු 04 x 4 = 16)

♦ (උ) සහ (ඌ) ප්‍රශ්න දෙකටම පිළිතුරු සපයන්න.

(උ) පහත සඳහන් උද්ධෘත අතුරෙන් හතරක අවස්ථා සම්බන්ධ ය දක්වන්න.

(i) 'එදැතුරේ දනක් පිනක් කරන්නා නුදුටුම්හ.'
(ii) 'බත් උපදිනේ බඩසලින් නොවෙයි, සැළියෙනැ'
(iii) 'මැගෙන් මට ප්‍රයෝජන නැතැ'
(iv) 'එම්බල සගය, තාගේ දුවක් කුලවන්තයන් මිස සමාන ජාති ඇති පුරුෂයන් නොකැමැත්තී ල'
(v) 'අවුරුදු දෙකක් තිස්සේ මගේ දේ කෑවා'
(vi) 'නිවටයා දැක්කාම තමයි එළුවන් නිකට පාන්නේ'
(vii) 'සිප් සලට නොආවද නැත වරද'

(ලකුණු 03 x 4 = 12)

(ඌ) පහත දැක්වෙන කාව්‍ය නිර්මාණයෙහි වස්තු විෂයයෙහි හා අලංකාර භාවිතයෙහි විශේෂතා පිළිබඳ අවධානය යොමු කරමින් රසාස්වාදයක යෙදෙන්න.

මිනිහා නඟන කටහඬ නො ම වැකෙන කනේ
ඇත මේ කුරුලු කූඩුව උස ගහක බෙනේ
නැත උවදුරක් මෙහි මෙතුවක් පහළ වුණේ
පැටවගෙ කුඩා දෙනෙතට නිල් අහස පෙනේ

උණුසුම් ගතිය ඇතිමුත් සිය කැදැල්ලෙහි
පැටවා කැමති නැත හිර වී විසිල්ලෙහි
නෙනෙතට නිල් අහස යොමු වන ඇසිල්ලෙහි
ඔහු යෙදෙනවා නිදහස ගැන සෙවිල්ලෙහි

මවුපිය කුරුල්ලන් රැකවරණය ඇතුව
උන්ගේ ආලයේ වෙසෙතත් ගජමුතුව
පැටවගේ දෙනෙත පවතී කවදත් රතුව
සැපතක් ඔහුට නැත ඉගිළෙන්ට නැතුව

දවසට සිය විටක් මවු පිය දෙදෙන විසින්
කටට ම හෙළන මුත් ආහර කුරුලු රසින්
පිට වන තුරා ඔහු හිර වී සිටින ගසින්
ඉගිළෙන සිහින පිට මං කළ නොහැක හිසින්

අරුණලු වැටෙයි පොඩි සිදුරෙන් කුරුලු ගෙට
ගී හඬ පිටත් වෙයි රුක් ලිය මුදුන සිට
කවුළුව තුළින් එළියට හිස දමන විට
හොඳ බව පෙනෙයි මෙහි ඇතුළට වැඩිය පිට

උවදුරු එමට ඇති මුත් එළිමහන තුරේ
පැටවට පෙනෙයි එහි පවතින කුරුලු පොරේ
කොපමණ කලත් ගත වේවි ද මෙහෙම හිරේ
සිතිවිලි නිසා ඇති නිදිබර ගතිය හැරේ

| | |
|---|---|
| සටහනක් නැතිව සැපතක් ඇති විය | නොහැක |
| මේ රැකවරණ තුළ ඇති සුවසිරි | දුකෙක |
| උවදුරු දිගේ යන දිග මාවත | මිසක |
| නිදහස කරා යන වෙන පාරක් | කිමෙක |

| | |
|---|---|
| මවුපිය කුරුල්ලන් ආහර රැගෙන | කටින් |
| ආවා පුරුදු ලෙස පැටියා දකින | අටින් |
| දුටුවා හිස් ව ඇති බව ගෙය එහෙම | පිටින් |
| පැටවා ගිහින් එළි වෙන කොට හතර | වටින් |

(2) පුද්ගල මසුරු බව මට්ටකුණ්ඩලී කථා වස්තුව තුළින් ඉස්මතු කිරීමට ධර්මසේන හිමියන් දැක්වූ වර්ණනා චාතුර්යය පැහැදිලි කරන්න.

(3) මිනිසුන්ගේ කථා ඇසීමේ රුචිකත්වය වඩවමින් සසර භය පෙන්වීමට පූජාවලි කතු තුමා ගත් උත්සහය අනුරුද්ධ කුමාර කථාව ඇසුරෙන් පහදන්න.

(4) හෙළ හවුලේ කවීන් තම නිර්මාණ තුළ ළමා ලෝකයට ද සුවිශේෂී ඉඩකඩක් විවර කළ බව පෙනේ. ඔබට නියමිත පද්‍යයක් ඇසුරෙන් මේ කියමන විමසන්න.

(5) නවකථාවක ප්‍රධාන ලක්ෂණ තුනක් ඔබට නියමිත බැද්දේගම නවකතාව ඇසුරෙන් පැහැදිලි කරන්න.

(6) (i) පුරාතන පද්‍ය සාහිත්‍යයේ ස්වර්ණමය යුගය ලෙස සැලකෙන කොට්ටේ යුගයේ සන්දේශ කාව්‍යයක් හා ප්‍රශස්ති කාව්‍යයක් පිළිබඳ සැකෙවින් විස්තර කරන්න.

(ii) ගුත්තිල කාව්‍යයේ ඔබට නියමිත පද්‍ය 2 ක් අසුරු කරගෙන වෑත්තේවේ හිමියන්ගේ කවිත්වය පිළිබඳ සාකච්ඡා කරන්න. හෝ ගුත්තිල කාව්‍යයේ අන්තර්ගතය කෙටියෙන් හඳුන්වා දෙන්න.

(7) කෙටිකතාවක ලක්ෂන 3 ක් දක්වා ඒ පිළිබඳ විස්තර කරන්න.

(8) පෙමතො ජායතො සොකො නාට්‍ය පෙළ ඇසුරෙන් එහි කථා පුවත විස්තර කරන්න.

(ලකුණු 15 x 4 = 60)

* * * *

# පිළිතුරු

02.

(අ) (i) තම සුවාමිපුරුෂයාගේ මසුරුකම නිසා කීමෙන් ප්‍රයෝජනයක් වේ ද ?

(ii) ප්‍රතිකර්මයක් දන්නා කෙනෙකු කැඳවාගෙනවිත් ප්‍රතිකර්මයක් කරවන ලෙස

(iii) මට්ටකුණ්ඩලී පුතණුවන් නොකීවත් රෝගයක් පීඩාවක් ඇති බව දැනේ.

(iv) කතා කොට

(ආ) (i) වාර තුනකි.

(ii) ඇයට ම සිතා පහළ වීම (තනිවම සිනා සීම)

(iii) පුරුෂය / කොල්ල නැති යන සංඥා නාමය සහිත කැවුම් මගේ පුතාට දෙන්න.

(iv) සම්පත් සහිත කුලය / උසස් කුලය

(ඉ) (i) කුලීකරුවෙක්

(ii) දුප්පතෙකු වී නූපදින ලෙසත් රාජ කුලයක ඉපදීමට නැත යන වචනයේ අදහසක් නොදැනගනීවා යන්නත්

(iii) එක ආත්මයක දුප්පත් කුලයක උපත ලබා අශ්වයින් සඳහා තණ කොළ කපමින් තණ කොළ කෑ අදමින් ජීවත් වීම.

(iv) කුලී වැඩ

(ඊ) (i) එක් පවුලකින් එක් පුරුෂයෙක් මහණ වීම

(ii) එක් වාරයක් කෑමට ලැබීම, පිණ්ඩපාත යාමට සිදු වීම, බඩගිනි බව පැවසිය නොහැකි වීම. ආහාරවල රස ගුණ ප්‍රකාශ කළ නොහැකි වීම.උණුසුම්ව අවශ්‍ය ආහාර සිසිල්ව ලැබිමත් සිසිල්ව අවශ්‍ය ආහාර උණුස්මව ලැබීමත්, තනිව ජීවත් වීමට සිදුවීම, ගස් මුල් හෝ සොහොන් බිම්වල භාවනානුයෝගීව සිටීමට සිදුවීම. (මින් පිළිතුරු 04 ක් තිබුණත් සෑහේ.)

(iii) මල්ලි බුදුරජාණන්වහන්සේ වෙත ගොස් අප සහෝදරයන් දෙදෙනා බැවින් එක් අයෙක් මහණ විය යුතුය.

(iv) තනිව ම

(උ) (i) ණිල මාණික්‍ය කාන්තිය පැතිරී නගර ආකාශයේ ඇති සුදුවලාකුළු නිල් පැහැවීම.

(ii) වැසි වසින ස්වරූපයකින්

(iii) ඇත්තු ද ඇත් රජුන් විශේෂයෙන්

(iv) දිය බිඳු රාශියෙන්

(ලකුණු 04 x 4 = 16)

(ඌ) (i) දඹදෙනි රාජධානි සමයේ ධර්මසේන හිමි රචිත සද්ධර්ම රත්නාවලියේ මට්ටකුණ්ඩලී කථාවස්තුවෙන් උපුටාගන්නා ලදි. අදින්න පුබ්බක බමුණා විසින් මට්ටකුණ්ඩලී දිව්‍ය ලොකයේ ඉපදුණා යයි කී අවස්ථාවේ මට්ටකුන්ඩලී දිව්‍ය පුත්‍රයාගෙන් මෙසේ අසන ලදි.

(ii) දඹදෙනි රාජධානි සමයේ මයුරපාද පරිවෙනාධිපති බුද්ධ පුත්‍ර හිමියන් විසින් රචිත අනුරුද්ධ කුමාර කථාවෙන් උපුටාගන්නා ලද්දකි. බත් උපදින්නේ කොයින්දැයි සැක කළ අවස්ථාවේ කිම්බිල කුමරු විසින් භද්දිය සහ අනුරුද්ධ කුමරු වෙත ප්‍රකාශ කරන ලදි.

(iii) කෑ ගල රාජධානි සමයේ රචිත ජාතක පොතෙහි එන චුල්ලධනුද්ධර ජාතකයෙන් උපුටා ගන්නා ලද්දකි. චුල්ලධනුද්ධරයන් මරා මරා ස්ත්‍රිය තනි කර දමා යාමට සැරසෙන විට තමා ම සිතන්නකි.

(iv) ගම්පොළ රාජධානි සමයේ ෂෂ වන ධර්මකීර්ති රාජ සමයේ හිමියන් විසින් රචිත ස්වර්ණතිලකා වස්තුවෙන් උපුටා ගත්තකි. රජු විසින් ස්වර්ණතිලකා වස්තුවෙන් උපුටා ගත්තකි. රජු විසින් ස්වර්ණ තිලකාගේ පියාණන් වෙත කළ ප්‍රකාශයකි. සැඩොල් තරුණයා ස්වර්ණතිලකාවන් උසස් තුලවල අය පහත බව රජුට කී අවස්ථාවේ.

(v) ලෙනාර්ය වුල්ෆ් විසින් රචිත බැද්දේගම නවකථාවෙන් උපුටාගත් පාඨයකි. ඔවුන්ට කොටගොඩ ගෑනියක් යෝජනා කළ විට ඊට අකමැත්ත ප්‍රකාශ කළ අවස්ථාවේ ආරච්චි ඔවුන්ට කළ ප්‍රකාශයකි.

(vi) මාර්ටින් වික්‍රමසිංහ මහතා ලියූ වහල්ලි කෙටිකථාවෙන් උපුටාගත් පාඨයකි. උපාලිස්ගේ දුව හඳයාට පුන්නක්කු දීමට ගිය අවස්ථාවේ හඳයා ඇයට අනින්නට සැරසුණු විට ඇය හඳයාට මෙසේ ප්‍රකාශ කරයි.

(vii) මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර රචනා කළ 'පෙමතො ජායතො සොකො' නාට්‍යයේ ස්වර්ණ තිලකා දැක කැළඹුණු උද්දාල ඇඳුරුතුමා වෙත අග්නිදත්ත සිසුවා කළ ප්‍රකාශයකි.

(ලකුණු 03 x 4 = 12)

(ඒ) සාගර පළන්සූරිය කවියාගේ ඉගිළෙන සිහින නිර්මාණයයි. මව්පිය රැකවරණය දිවි රැකගන්නා කුරුලු පැටවෙකු නිල් අහස ගෙන ගැටි නිදහස සොයා යාමට සිදුකරණ අපූරු අවස්ථාවක් පුංචි කුරුලු පැටවකුගේ සිතුවිලි විවරණයක් වස්තු විෂය වේ.

අලංකාර ගැන කථා කිරීමේ දී මාත්‍රා දහ අටක් වන සිවුදු සෝෂ වීරිත භාවිතා කර ඇත. සමස්ත රචනයට සංකේතයකි රූප අලංකාර, කාව්‍යෝක්ති යෙදුම් නවමු කවි බසක් භාවිතය ක්නට ලැබේ. විප්ලව වාදී අදහස් ඇසුරෙන් කුරුලු පැටවාගේ මානසික ස්භාවය එලි දක්වා ඇත. තාර්ථවත් යෙදුම් භාවිතා කර ඇත. සුදුසු පරිදි ලකුණු ප්‍රධානය කරන්න.

(2)

(3)

(4)

(5)

(6) (i)

(ii)

(7)

(8)

මතුගම අධ්‍යාපන කලාපය Matugama Education මත්තුගම කල්වික් වලයම් මතුගම අධ්‍යාපන කලාපය Matugama Education මත්තුගම කල්වික් වලයම්

# මතුගම අධ්‍යාපන කලාපය

## දෙවන වාර පරීක්ෂණය - 2020 මාර්තු

| සිංහල - II<br>71 S - II | 12 ශ්‍රේණිය | කාලය : පැය 3 යි |
|---|---|---|

- I කොටසේ 1 ප්‍රශ්නය ද, II කොටසේ 2,3 ප්‍රශ්නය ද, ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.
- පළමු ප්‍රශ්නයේ ඇති සියලුම අනුකොටස්වලට මෙම ප්‍රශ්න පත්‍රයේ ම පිළිතුරු සපයන්න.
- I කොටසේ හා II කොටසේ පිළිතුරු පත් සමඟ අමුණා භාරදෙන්න.

## I කොටස

01. එක් එක් ප්‍රශ්නයට වඩාත්ම ගැළපෙන පිළිතුර තෝරා ගෙන, එයට හිමි අංකය වරහන තුළ ලියන්න.

1.1. සිංහල වර්ණ මාලාවේහි එන 'ල' යන්න කුමන අක්ෂරයක් ද ?

1. වර්ගාන්ත
2. අර්ධ අනුනාසික්‍ය
3. ඌෂ්ම
4. පාර්ශවීය
5. ස්පර්ශ

1.2. නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත පද පේළිය තෝරන්න.

1. මොළකැටි, මාංෂභක්ෂක, දෘෂ්‍යකාව්‍ය, සලපතල, සුභාශිංශන
2. මොළකැටි, මාංසභක්ෂක, දෘශ්‍යකාව්‍ය, සලපතළ, ශුභාසිංසන
3. මොලකැටි, මාංශභක්ෂක, දෘෂ්‍යකාව්‍ය, සළපතළ, සුභාශිංසන
4. මොලකැටි, මාංසභක්සක, දෘශ්‍යකාව්‍ය, සලපතළ, ශුභාසිංසන
5. මොළකැටි, මාංශභක්ෂක, දෘෂ්‍යකාව්‍ය, සළපතල, සුභාසිංසන

1.3. අකාරාදී පිළිවෙළ අනුව නිවැරදිව ලියා ඇති පද පේළිය තෝරන්න.

1. ක්ෂීරපථය, සනත්වය, චින්තනය, නියාමනය
2. ශ්වසනය, විසන්ධි, සෛද්ධාන්තික, ස්වරාලය
3. දණ්ඩනය, තණ්ඩය, තාණ්ඩව, මාණ්ඩලික
4. ජාත්‍යාලය, ඡද්දන්ත, දැකුම්කලු, කයෝර
5. මාර්ග, පැළපත, ඓන්ද්‍රීය, යෂ්ටි

1.4. පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් නිරවද්‍ය ප්‍රකාශය තෝරන්න.

1. '්‍ය' ට පූර්වයෙන් යෙදෙන ව්‍යඤ්ජන අක්ෂරය හල් කොට ලියනු නොලැබේ.
2. 'ය' කාරයෙහි දෙවන භාගයට සමානකම් දරණ සංකේතයක් නොවේ.
3. 'ර්' යන්න සමඟ 'ය' කාරය යෙදෙන විට ඒ වෙනුවට '්‍ය' ලිවිය හැකිය.
4. 'ය' කාරය වෙනුවට '්‍ය' භාවිත කළ හැකිය.
5. ' ර්‍ ' (රේඵය) සමඟ ද '්‍ය' යෙදිය නොහැක.

1.5. එකිනෙකට අනුරූප වන සේ වචන යුගල යෙදී ඇති වරණය තෝරන්න.

1. ශුභ මුහුර්තය, විදේශ ප්‍රවෘත්ති, කර්තෘ වාක්‍ය, නිපැයුම් බඩු
2. මව් භාෂාව, ශිෂ්‍ය සබඳතා, ප්‍රවෘත්ති පත්, ඥාණ සාගරය
3. ආඥාචක්‍රය, ප්‍රවෘත්ති විමසුම, කනිටු විදුහල, ගගන යාත්‍රාව
4. අමාත්‍ය මණ්ඩලය, ධර්ම දේශනය, මුහුදු බාදනය, කල්‍යාණ මිත්‍ර
5. දම් දෙසුම, බැතිපෙම්, සිසිල් වස්ත්‍ර, සූර්ය මඬල

1.6. තත්සම පද පමණක් යෙදී ඇති වරණය කුමක් ද ?

1. නඳුන්, දඹ, චන්දන, සෙමෙර
2. වෛශාඛ, විශේෂ, විදසුන්, දන්සල
3. සාහිත්‍ය, වෘත්ත, හිවල්, පුහුදුන්
4. පොළොව, ගොයුම්, රුදුරු, නැව්
5. ස්කන්ධ, වින්දන, සුන්දර, ඉන්ද්‍රනීල

1.7. තත්භව වචන පමණක් අන්තර්ගත වරණය තෝරන්න.

1. චීවර, සක්වල, දුශ්ශීල, මෙහෙසුරු
2. කෙස්, පෙදෙස, ආසන, සමාස
3. ඉඳුනිල්, සුවඳ, ගැඹුරු, සිතුවම්
4. වෛශ්‍රවණ, ශෛල, වෘක්ෂ, වෛද්‍ය
5. ස්වප්න, සතුටු, සදහම්, සප්ත

1.8. තරණ, සම්ප්‍රදාන, අවධි හා ආධාර යන විභක්ති සමාස පද පිළිවෙළින් දක්වා ඇති වරණය තෝරන්න.

1. සුරබොජුන්, මිණිමුතු, පින්හාල්, සරාසඳ
2. කිරිබත්, ගුරුපඬුරු, රජබිය, මුහුදුදිය
3. පරපුටු, රජපිරිස්, බමුණුදන්, මව්කිරි
4. දීබත්, ගවමස්, ගම්වැසි, බුදුදහම
5. අත්කම්, බුදුගුණ, දෙව්දත්, දහම්සොඬ

1.9. කෘදන්තයක් නොවන පදයක් අන්තර්ගත වරණය තෝරන්න.

1. ලිඛිත, රචිත, දේශිත, සංශෝධිත
2. දුරදක්නය, දවටනය, ලියනය, බස්නාව
3. නැටිලි, කැපිලි, ඉවිලි, බැලිලි
4. කපන, සිඟන, උරණ, නටන
5. කෙටූ, බැලූ, ලියූ, වැටූ

1.10. පහත සඳහන් උද්ධෘතවල තද **<u>කළු අකුරෙන්</u>** මුද්‍රිත පද අයත් ක්‍රියා වර්ග පිළිවෙළින් දක්වා ඇති වරණය තෝරන්න.

(අ) සුවිසල් අරුණ දද **<u>පෙර'ඹර දිලෙද්දී</u>**

(ආ) කවුරුත් නුඹට ආදරයයි එදැන **<u>වරෙන්</u>**

(ඇ) රහසක් **<u>නොවේවා !</u>** යට ගිය යුගයේ තතු

(ඈ) **<u>අසමින්</u>** ගී සුමිහිරි

1. අසම්භාව්‍ය ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, ප්‍රාර්ථනා ක්‍රියා, විධික්‍රියා
2. අසම්භාව්‍ය ක්‍රියා, විධි ක්‍රියා, ආශිර්වාද ක්‍රියා, මිශ්‍ර ක්‍රියා
3. ප්‍රයෝජ්‍ය ක්‍රියා, විධික්‍රියා, අවසාන ක්‍රියා, පූර්ව ක්‍රියා
4. අවසාන ක්‍රියා, විධි ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, පූර්ව ක්‍රියා
5. අවසාන ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, ප්‍රයෝජ්‍ය ක්‍රියා, විධි ක්‍රියා

1.11. තද්ධිතයක් නොවන පදයක් අන්තර්ගත වරණය තෝරන්න.

1. ගැමි, තොටි, ගෙඕ, දැහැමි
2. සෙනෙහස්, වරලස්, සිසිලස්, ඉහිලස්
3. නුවනත්, සවත්, කොපුලත්, ගහණත්
4. ගුණවත්, පබාවත්, පෙම්වත්, පින්වත්
5. කැඳිති, සිඟිති. පොඩිති, කැනිති

1.12. උපසර්ගයක් යෙදී නැති පදයක් සහිත පද පේළිය තෝරන්න.

1. ආගම, ආචාර, ආදර, ආධාර
2. සම්මාන, සංග්‍රහ, සංවර, සන්තාප
3. ප්‍රමාණ, ප්‍රබල, ප්‍රජාව, ප්‍රයෝග
4. අවධාන, අවශේෂ, අවවාද, අවමාන
5. උපද්‍රව, උපසම්පදා, උපසර්ග, උපස්ථාන

1.13. නිපාතයක් නොවන පදයක් අන්තර්ගත වරණය තෝරන්න.

1. උදෙසා, පිණිස, සඳහා, බැවින්
2. තෙක්, තාක්, දක්වා, පාසා
3. විසින්, කෙරෙන්, කෙරෙහි, තුළ
4. මෙන්, එව්, බඳු, අයුරු
5. නිසා, බැවින්, යෙහෙන්, හෙයින්

1.14. "ජනාධිපතිතුමා ඡන්දයෙන් ජය ලබා රටදැයසමය ආරක්ෂා කර ගන්නා බව ප්‍රකාශ කළේය." යනු වාක්‍යයෙහි වචන යෙදී ඇති පිළිවෙළ අනුව තද කළු අකුරෙන් ඇති පද අයත් වන්නේ කුමන ව්‍යාකරණ අංගවලට ද ?

1. විභක්ති, සන්ධි හා උපසර්ග
2. තද්ධිත, විභක්ති හා සමාස
3. සන්ධි, විභක්ති හා සමාස
4. සන්ධි, සමාස හා විභක්ති
5. විභක්ති, සන්ධි හා තද්ධිත

1.15. සමාන ව්‍යාකරණ ලක්ෂණ නිරූපණය කරන ක්‍රියා රූප සහිත වරණය තෝරන්න.

1. දක්වත්, කියවත්, විසඳති, හඬත්
2. ගයද්දී, වයද්දී, නැටුවොත්, හඬද්දී
3. කැඩුවේය, බැලුවාය, ලියුවාය, කළාය
4. කරවයි, නළවයි, බලවයි, වයයි
5. වඳිමින්, දකිමින්, දමාලා, පිසපිස

1.16. සමාසයක් නොවන පදයක් ඇතුළත් වරණය තෝරන්න.

1. අසුර, අකුසල්, අනදර, නොමිනිස්
2. කුකවි, කුපුරිස්, දුෂ්ට, දුදන
3. යව්දිව්, යතලබ, යත විදි, අනුබල
4. උපනගර, උපනායක, පබල, ප්‍රසිද්ධ
5. කොරොස්කට, හුඹස්කට, ගල්හිත, කිරිදත්

1.17. එකම වර්ගයට අයත් සන්ධි පද අන්තර්ගත වරණය තෝරන්න.

1. වැල්ලවුරු, නුවණක්කාර, පොල්ලත්ත, පත්තිරු
2. වක්කඩ, වප්පිහිය, පන්නම්, දුප්පත්
3. නෙළුම්මල්, අම්මල්, නිලුපුල්, වංමුතු
4. අත්තම්, වත්තම්, ගෙත්තම්, අල්ලස්
5. වටොර, දැත, මැත, දැගසවු

1.18. ව්‍යාකරණානුකූලව නොගැළපෙන පදයක් ඇති වරණය තෝරන්න.

1. ලඹසවන්, මියුරු, තිනෙත්, දැමිදුරු
2. දුෂ්කර, නිර්ගුණ, නිර්දෝෂ, දුර්ජන
3. අද්‍යතන, පුරාතන, සදාතන, නූතන
4. ලියමන්, කියමන්, වියමන්, පිසමන්
5. පුතණු, සිටාණ, දුවණි, දියණි

1.19. ව්‍යාකරණානුකූලව නිවැරදි වැකිය තෝරන්න.

1. මූලාසනයේ කථාවෙන් අනතුරුව සභා තොමෝ සතුටින් විසිර ගිය හ.
2. අස්හු සිවු දෙනෙකු රිය ඇදගෙන ගියහ.
3. අනේ පිඬු සිටාණන් බුදුපාමොක් මහ සඟනට නිබඳ දන් දුන්හ.
4. ඔවුහු එහි යතොත් අපි එහි නොයමු.
5. නිළියක් වේදනාවෙන් ඇඬූහ'යි වාර්තාකරුවෝ පැවසූහ.

1.20. ලේඛන ව්‍යවහාරයට වඩාත් සුදුසු වාක්‍යය සහිත වරණය තෝරන්න.

1. මම කළයක් අරන් ළිඳට යමි.
2. එහෙනං හවස් ජාමේ මේ පැත්තේ එන්නකෝ
3. වෛද්‍යවරු හොඳින් ප්‍රතිකාර කිරීම නිසා රෝගීන් ඉක්මන් සුවය ලබති.
4. එහෙත් හරි වැස්ස, මෙහෙත් හෙම වෙන්නැ
5. මොකද ඔය ගොම්මනේ කරන්නේ හනික ගෙට එන්නයැයි අම්මා කිව්වා.

(ල 1 X 20) = 20

## II කොටස

♦ මෙම කොටසින් 2, 3 ප්‍රශ්න ඇතුළුව ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.

02. (අ) පහත සඳහන් පාඨය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

සිරිලක සරු බිමකි. පස සරුය. වැසි නොමඳය. වියළි යයි කියන කලාපයට පවා ලැබෙන වැසි නොපමණ නොවේ. එහි ද රන් පඬුවන් පැහැගත් සරු පසය. සොබා දහම් දිනීමේ වෙර වෑයම් තුළින් හූ සම්පතක් වැස්සත් ඵලදායී කෘෂිකර්මය බවට පෙරලූවෝ මෙරට මුල් පදිංචි කරුවෝය.

ශත වර්ෂ ගණනක් මුළුල්ලේ රාජ්‍ය තාන්ත්‍රිකය සංකේන්ද්‍රණය වන්නට විය. කුඩා වැව් එකිනෙකට හසු කෙරෙමින් මහා වාරිමාර්ග රටාවක් ගොඩ නැගිණ. බුදු දහම ඇසුරින් අද්විතීය සංස්කෘතියක් ගොඩ නැගිණ. හුදකලා ගැමි ආර්ථිකයෙහි මධ්‍යගත වීමක් දක්නා ලැබුණේ කිතු සමයට පෙර සිදු වූ එවැනි වෙනස් වීම් තුළිනි. ක්‍රිස්තු පූර්ව 5 වන සියවසේ පමණ පිහිටවුණු කේන්ද්‍රගත රාජ්‍යයන් කිතුසමයේ මුල්භාගය වන විට කිසියම් පමණකට මෝරා තිබිණ. මෙම ආර්ථික ක්‍රමයේ ප්‍රධාන ලක්ෂණයන් වූ වාරිමාර්ග රටාව ව්‍යාප්ත වීම, රජයේ ආදායම් මාර්ග සහ දේශපාලන ක්‍රමය අතර සම්බන්ධතාව කේන්ද්‍රගත වීම, සංස්කෘතිය අතින් බලන විට බුදු දහම පැලපදියම් වෙමින් තිබීම යනාදිය යටත් පිරිසෙයින් පළමු කිතු සියවස් 10 දක්වා මෙරට පැවති මූලික ප්‍රවණතාවන් වේ.

පළමුවන දහස් වසරේ අවසාන සියවස් කිපය වන විට, වාරිමාර්ග රටාව දීප ව්‍යාප්ත පදනමක් මත විසිරී ගොස් තිබිණි. මහ වැව් කැනිණ. දිගු ඇලවල් කැණින. ගංගා හරහා වේලි බැඳිණ. ආර්ථික ක්‍රියාවලියේ ප්‍රධාන අංගය වූයේ ගැමියන් විසින් සහල් නිපදවීමය.නිපැයුණු වැඩිපුර අතිරික්තය රාජ්‍ය තාන්ත්‍රික සහ වැඩවසම් නිල කොටස්වලට පෝෂණය සඳහා විය. මහා වාරිමාර්ග සහ වෙහෙර විහාර ඉදිකිරීම සඳහා අවශ්‍ය වූ ශ්‍රම හමුදාව යැපුනේ මෙම අතිරික්තයේ උදවුවෙනි.

1. මෙරට මුල් පදිංචිකරුවන්ගේ ආර්ථික රටාව කුමක් ද ?
2. වියළි කලාපයේ දක්නට ලැබුණු ජල හිඟයට පිළියම් යෙදුණේ කෙසේ ද ?
3. ක්‍රි. ව. 10 දක්වා මෙරට පැවති මූලික ප්‍රවණතා කවරේ ද ?
4. මෙම ඡේදය අනුව කියවෙන්නේ ලංකාව සහලින් ස්වයං පෝෂණය වූ බවයි. මෙය නිවැරදි ද ?
5. ආර්ථික ක්‍රියාවලියේ ප්‍රධාන අංගය කුමක් ද ?
6. මහා වාරි මාර්ග සහ වෙහෙර විහාර ඉදි කිරීම සඳහා අවශ්‍ය වූ ශ්‍රම හමුදාව යැපුණේ කෙසේ ද ?

(ල. 12)

(ආ) පහත දැක්වෙන උද්ධෘතය කියවා, එහි වචන සංඛ්‍යාව තුනෙන් එකක් පමණ වන සේ සාරංශ කොට ලියා, සාරාංශය අග වචන සංඛ්‍යාවද සඳහන් කරන්න.

අධ්‍යාපන ක්‍රියාවලියේ පූර්ණ ප්‍රතිඵලය නිතරම සිහියේ තබාගත යුතුව ඇත. ඇතැම් කරුණුවලට අවධානය යොමු කර අන්‍ය කරුණු අමතක කැරෙන අධ්‍යාපන ක්‍රමයක් සතුටුදායකයයි පිළිගත නොහැකිය. එසේ වූ විට බාල පරම්පරාව එක් අංශයකට පමණක් නැඹුරුව වැඩෙන අතර, ඔවුහු ජීවිතය පිළිබඳ සමතුලිතතාවක් නැත්තෝ වෙති. ජීවිතයේ සැපවත් දෙයක් හැකි තරම් ප්‍රමාණයක් ලබාගැනීම මිනිස් රුචියේ අවසාන පරමාර්ථය සේ සැලකෙන ඉන්ද්‍රිය පිනවන පහසුකම්වලින් සම්පූර්ණ වර්තමාන සමාජයේ හි, අධ්‍යාපනය නැමැති යහමග යවන බලවේගය සුපරීක්ෂාකාරීව

සැලසුම් කළ යුතුවේ.සිද්ධස්ථානයේ දී කැරෙන ආගමික කටයුතු ඇරුණ විට පංති කාමරයේ දී ආගම ධර්මය ඉගැන්වීම කෙරෙහි අවධානය යොමු කිරීමෙන් ද පාසැල හා සමාජය හා අතර කිට්ටු සම්බන්ධතාවක් ඇති කරන විවිධ ක්‍රම මාර්ගයෙන් ද සුචරිත සාරධර්ම පිළිබඳ නිවැරදි අවබෝධයක් ඇති කිරීම කෙරෙහි අද මහත් සැලකිල්ලක් දැක්වෙයි. ජාතික වෙනුවෙන් කෙරෙන සේවාව අධ්‍යාපන ප්‍රතිපත්තියෙහි මූලික ලක්ෂණයක් වී තිබේ.

අධ්‍යාපනය මිනිසාගේ ප්‍රගතියත් සමග අත්වැල් බැඳගෙන යා යුතුය. කවර හෙයින්ද යත් අද අධ්‍යාපනය අනාගතයේ නිර්මාතෘවරයා වන බැවිනි. යම් ජනතාවකට තම අනාගත සුභ සිහින සාක්ෂාත් කරගත හැක්කේ යථා යෝග්‍ය ලෙස සිතා බලා නිවැරදි ලෙස සැලසුම් කර බුද්ධිමත් ලෙස ක්‍රියාත්මක කැරුණු අධ්‍යාපන ක්‍රමයකින් පමණි.

(ල. 13)

03. දී ඇති මාතෘකාවලින් එකකට අදාලව වචන 300 - 350 අතර වන සේ විශ්ලේෂණාත්මක රචනාවක් ව්‍යාකරණානුකූලව ලියන්න.

1. ලෝක බල අරගලය හමුවේ ජීවයේ හෙට දවස
2. මානව ක්‍රියාකාරකම් හා සොබා දහම
3. සමාජ සාරධර්ම වර්ධනයෙහි ලා සාහිත්‍යයේ කාර්යභාරය
4. රටක සංවර්ධනය ගොඩනැගීම සඳහා ක්‍රීඩාවේ අවශ්‍යතාව
5. නව තාක්ෂණය අධ්‍යාපනය කෙරෙහි ඇති කෙරෙන බලපෑම

(ල. 25)

04. (අ) පහත සඳහන් වාක්‍යවල සදොස් තැන් ඇතොත් නිදොස් කොට ලියන්න.

1. නිළියක් වූ ඇ ආදරණීය බිරිඳක් ද වූවාය.
2. මන්ත්‍රීවරු සියලු දෙනා අද දින සැසි වාරයට වාර්තා කොට ඇත.
3. රජය විසින් ගුවන් හමුදාවට නවක සෙබළුන් බඳවා ගැනෙති.
4. සියලු ශ්‍රී ලාංකිකයෝ බෞද්ධයන් නොවෙති.
5. ගුරුළුගෝමීන් අමාවතුර රචනා කළහ.

(ල. 1 x 5 = 5)

ආ) පහත සඳහන් වාක්‍ය කර්මකාරකයට හරවන්න.

1. විදුහල්පතිතුමා ශිෂ්‍ය නායකයන් අගය කරයි.
2. ව්‍යාකරණඥයෝ නවභාෂා රීතීන් නිපදවති.
3. ජනාධිපතිතුමා විදේශ අමුත්තන් සාදරයෙන් පිළිගනියි.
4. වෛද්‍යවරු රෝගීන් පරීක්ෂා කළහ.
5. විද්‍යාචක්‍රවර්තියෝ බුත්සරණ රචනා කළහ.

(ල. 1 x 5 = 5)

ඉ) නිවැරදි වැකියක් නිර්මාණය කිරීම සඳහා සුදුසු පදය වරහන් තුළින් තෝරන්න.

1. දැහැමින් වෙසෙන (උපාසිකාවෝ / උපාසිකාවන්) දිවි මගෙහි ද (සිල්වත්හු / සිල්වතුන්) වෙති.
2. පරිසරය (හිතකාමියෝ / හිතකාමීන්) එය විනාශයට ලක් (කරන්නෝ / කරන්නන්) නීතියේ රැහැනට හසුකර ගත යුත්තාහ.
3. (කිඹුලෝ / කිඹුලන්) ගම් වදිති'යි (ගැමියෝ / ගැමියන්) බියෙන් පසු වෙති.
4. (ලෝකවාසීහු / ලෝකවාසීන්) කොරෝනා වෛරසයෙන් (බියපත්වූවෝ / බියපත් වූවන් ) වෙති.
5. මුනිදාස කුමාරතුංගයෝ දක්ෂ (ලේඛකයකු / ලේඛකයෙක් ) මෙන්ම (කවියෙක් / කවියෙකු) ද වූහ.

(ල. 1 x 5 = 5)

05. පහත දැක්වෙන වාක්‍යවල තද **කළු අකුරෙන්** මුද්‍රිත පදවල ව්‍යාකරණ අංගය දක්වා ඇත. ඒවායෙහි අනු අංගය දක්වන්න.

1. අනාගත **අභිවෘද්ධිය** **උදෙසා** මනා **හික්මීමකින්** හෙබි යොවුන් සමාජයක් අත්‍යවශ්‍ය වේ.
   (අභිවෘද්ධිය - උපසර්ග, උදෙසා - නිපාත, හික්මීමකින් - විභක්ති)
2. පාසල් ගීය **ගයද්දී** හැම දෙනා **ම** **හුනුස්නෙන්** නැගී සිටියහ.
   (ගයද්දී - ක්‍රියා , ම - නිපාත, හුනස්නෙන් - සන්ධි)
3. ඉකුත් දශකයේ දී **ළමා** **චිත්‍රපට** නිෂ්පාදනයට **සිනමාකරුවන්ගෙන්** ද මහගු සේවාවක් ඉටු විය.
   (ළමා චිත්‍රපට - සමාස, සිනමාකරුවන්ගෙන් - විභක්ති, ද - නිපාත)
4. සංදේශ කාව්‍යයක අන්තර්ගත වන **ස්වභාවෝක්ති** වර්ණනා කාව්‍ය **රචකයන්ගේ** නිසග කවීත්වය පිළිඹිඹු **කරන** කැටපතක් බව විචාරකයන්ගේ මතයයි.
   (ස්වභාවොක්ති - සන්ධි, රචකයන්ගේ - විභක්ති, කරන - කෘදන්ත)
5. **ජ්‍යෝෂ්ඨ** සිසුන්ගේ ක්‍රියා කලාපයන් නිසා ඇතැම් නවක **ශිෂ්‍යයෝ** සරසවිය අත්හැර යති.
   (ජ්‍යෝෂ්ඨ - තද්ධිත, ශිෂ්‍යයෝ - විභක්ති, හැර - ක්‍රියා)

(ල. 1 x 3 x 5 = 15)

06. අ) පහත දැක්වෙන වාක්‍යවල හිස්තැනට වඩාත් ම ගැළපෙන පදය පහත වරහන තුළ දී ඇති පද අතුරෙන් තෝරා ලියන්න.

1. මානව සංවර්ධනය ඇති කරමින් ජනතාව ..................... කටයුතුවලට සහභාගී කරවීමට යුනෙස්කෝව කටයුතු කරයි.
2. සම්පත්වලින්උපරිම ප්‍රයෝජන ලැබීමට සම්පත් හා ..................... අතර මනා ගැලපීමක් අවශ්‍යය.
3. නව ආර්ථික රටාව, සාමය හා සංහිඳියාව ඇති කිරීමේ .................. සමග එක් ව යා යුතුය.
4. පුද්ගලයන් අතර සාමකාමී සම්බන්ධතා ............... යුතුව පැවැත්විය යුතුය.
5. අගනුවර පමණක් නොව රටේ බොහෝ තැන්වල ද මිනිසුන්ටත් සත්වයන්ටත් ........................ පිහිටුවන ලදී.
6. සාරාර්ථ සංග්‍රහය නම් වෛද්‍ය ග්‍රන්ථය බුද්ධදාස අරතුමාගේ ස්මාරකයක් ලෙස පවතිනු ඇත.
   (ආරෝග්‍ය ශාලා, අධිෂ්ඨානය, අමරණීය, සංවර්ධන, සැලසුම්, සහජීවනයෙන්))

(ල. 1/2 x 6 = 3)

ආ) පහත දක්වා ඇති පද සන්ධිකර ලියන්න.

| | | | |
|---|---|---|---|
| 1. | දෙ + අවුරුදු | 2. | මුනි + ඉන්ද්‍ර |
| 3. | තුනු + අඟ | 4. | ගඟ + රන් |
| 5. | ශ්‍රවණ + ඉන්ද්‍රිය | 6. | සුණු + කම් |

(ල. 1/2 x 6 = 3)

ඉ) තද **කළු අකුරෙන්** මුද්‍රිත පදවල විභක්ති නම් කරන්න.

1. අතුරුදන් වූ **තම** දරුවා සොයා දෙන ලෙස ඕ සමන් **දෙවියන්ගෙන්** ඇයද සිටියාය.
2. එළවළු පැස හිස තබාගෙන **දූගි** **මව** **වෙළඳාමෙහි** යන්නීය.
3. වෙසතුරු නිරිඳු **යදියාට** **දරුවන්** දන් දිනි.

(ල. 1/2 x 6 = 3)

ඊ) අවශ්‍ය තැන්වල විරාම ලකුණු යොදා, පහත දැක්වෙන වාක්‍ය නැවත ලියන්න.

1. ඒ දියවැල හැඳින්වෙන්නේ කුරුසියෝ යනුවෙනි යි ශිෂ්‍යයා පිළිතුරු දිනි.
2. විශේෂ අමුත්තා සතුටින් පිනා ගියේය ; නළුවන් කරා පා නැගුවේය සතුට පළ කළේය සමු ගත්තේය.
3. කෝට්ටේ යුගයේ සංදේශ කාව්‍ය සැළලිහිණි , ගිරා හංස, පරෙවි, කෝකිල ලෙස හඳුනා ගත හැක

(ල. 1/2 x 6 = 3)

උ) පහත දැක්වෙන ප්‍රකාශනවල එක් එක් ප්‍රකෘති කථනය විකෘති කථනයට හරවා ලියන්න.

1. "මම මගේ කාර්යය අකුරට ම ඉටු කළෙමි" යි ඇමතිතුමා පැවසීය.
2. "මේ දිනවල පැතිරී යන වසංගත රෝග තත්වය නිසා කුඩා දරුවන්, ගර්භනී මව්වරුන් හා වැඩිහිටියන් කෙරෙහි අවධානය යොමු කරමින් වැඩ සටහන් පවත්වන්නැ"යි ජාතික වසංගත මර්දන ඒකකය දැනුම් දෙයි.
3. "අද පටන් සමිතියෙහි න්‍යාය පත්‍රය වෙනස් කරනවා"යි සභාපති කියා සිටියේය.

(ල. 1 x 3 = 3)

07. පහත ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

**ඓතිහාසික** **සාහිත්‍යයෙහි** ආධාරය නොමැති ව හුදෙක් සෙල් ලිපි ම පදනම් කොටගෙන මෙරට අධ්‍යාපනික ප්‍රතිපත්ති හා ව්‍යවහාරය පිළිබඳ ව ක්‍රමාණුකූල ව වෘත්තාන්තයක් ඉදිරිපත් කළ නොහැකි තරම්ය. බෞද්ධ **විහාරස්ථානය** සාමාන්‍යයෙන් ශාස්ත්‍රෝද්ග්‍රහණ ස්ථානය විය. මෙහිදී බෞද්ධ ශික්ෂාපද සහ වත් **පිළිවෙත්** පමණක් නොව අධ්‍යාපනයට අයත් ලෞකික විෂයන් ද සැලකිල්ල ලද්දේය ශිෂ්‍යයනට වදින්නට සිදු වූ දුක් කරදර නොතකා හුදෙක් තමන් හට සැලැසෙන අභිවෘද්ධිය ම තකා මහත් **උද්යෝගයෙන්** හා **උනන්දුවෙන්** අනුරාධපුරයෙහි මේ අධ්‍යාපන ආයතනයන්ට ශිෂ්‍යයන් ඇතුල් වීම වූ කලී ඒවායෙහි විශිෂ්ටත්වය හුවා දක්වන ප්‍රත්‍යක්ෂ සාධකයකි. බුද්ධ ධර්මය රාජ්‍යාගම ලෙස ප්‍රතිෂ්ඨාපිත වූ පසු මහජනයා බෞද්ධ දිවි පෙවෙත පිළිගෙන ඒ අනුව ජීවත් වූහ. මනුෂ්‍යයන්ගේ පමණක් නොව, කෘමි, සිවුපා, සියොත් ආදීන්ගේ ද ජීවිතය අගය කිරීමට ඉගැන්වීමෙන් බුදු සමය ක්ෂුද්‍රතම ජීවියකුට පවා ස්වභාව ධර්මයෙන් ඉඩලැබෙන තාක් ජීවත්වීමට ඇති ඒකාන්ත අයිතිය පිළිගත්තේය.

1. ඡේදයේ තද **කළු අකුරින්** මුද්‍රිත වචන අකාරාදී පිළිවෙළට සකස් කර ලියන්න.
2. නොමැති, ආදීන්ගේ, අනුරාධුපරය යන වචනවලට යෙදී ඇති පිළි වෙන වෙනම ලියන්න.
3. ඉහත ඡේදයෙන් උපුටා දක්වන්න.
   1- දන්තෝෂ්ඨජ අක්ෂරයක් හා දන්තජ අක්ෂරයක් සහිත වචනයක්
   2- අඝෝෂ ඌෂ්මාක්ෂර දෙකක් එක ළඟ යෙදෙන වචන දෙකක්
   3- රකාරාංශය සහ මූලධජ අක්ෂර දෙකක් සහිතව වචනයක්
4. පහත සඳහන් පද විසන්ධි කර සන්ධි විධිය දක්වන්න.
   1. වෘත්තාන්තය 2. ක්‍රමානුකූල
5. පහත සඳහන් ව්‍යාකරණාංග සඳහා උදාහරණ ඡේදයෙන් උපුටා දක්වන්න.
   1- තද්ධිත ප්‍රත්‍ය වර්ග දෙකක්
   2- ප්‍රථම පුරුෂ අතීතකාල බහුවචන ක්‍රියා

(ල. 3 x 5 = 15)

08. පහත සඳහන් මාතෘකාවලින් තුනක් තෝරා කෙටි සටහන් ලියන්න.

1. ගෞරවාර්ථ තද්ධිත ප්‍රත්‍යය
2. අන්‍යාර්ථ සමාසය
3. සමුච්චයාර්ථයේ යෙදෙන නිපාත
4. මිශ්‍ර ක්‍රියා
5. මූර්ධජ අක්ෂර

(ල. 5 x 3 = 15)